# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1992/7 - 2016 නොවැම්බර් මස 07 වැනි සඳුදා - 2016.11.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56(1) වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අධ්‍යාපන සේවා කමිටුව වෙත බලතල පවරන ලද, අංක 1989/29 හා 2016.10.19 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනයෙහි පළ කරනු ලැබ ඇති ''ආ'' උපලේඛනයේ බලතල පැවරීමට අදාළ විධිවිධානවලට පහත සඳහන් විධිවිධාන ඇතුළත් කර එම උපලේඛනය 2016 ඔක්තෝබර් මස 20 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 1989/29 හා 2016.10.19 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනයෙහි අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,<br>
ලේකම්,<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2016 නොවැම්බර් මස 07 වැනි දින,<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,<br>
අංක 177, නාවල පාර,<br>
නාරාහේන්පිට,<br>
කොළඹ 05.


1A - PG 3221 — 107 (2016/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

"ආ" උපලේඛනය

| *I තීරුව*<br>*නිලධාරී ගණය* | *II තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|
| 8. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යටතට ගැනෙන,<br>I. දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන්<br>II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති තෘතියීක මට්ටමේ අධි ශ්‍රේණියේ/විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලැබූ සේවා ව්‍යවස්ථාව අනුව පත් කිරීම, උසස් කිරීම<br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම ඇතුළු සියලුම ස්ථාන මාරු කිරීම<br>III. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදය පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම |
| 9. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන සහ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, සියලුම නිලධරයන් (අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් නොවන දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නිලධරයන් සහ ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයන් හැර) | කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම |

11-1014

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.